# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2387/45 – 2024 ජූනි මස 07 වැනි සිකුරාදා – 2024.06.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2024 අංක 70 දරන ආඥාව**

මගේ යොමු අංකය: 13/99/FR/387.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: ප්‍රාලේ/3/3/5/2/14.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ II වැනි තීරයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

**හරින් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2024 අප්‍රේල් මස 10 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'' අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, ලග්ගල, පල්ලේගම.

2. **ඉඩමේ විස්තරය.–** මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ලග්ගල උඩසිය පත්තුව සුළු කොට්ඨාසයේ, අංක E 385 පිටවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පිටවල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මා 1529 හා 2010.07.30 දිනැති මූලික පිඹුරේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත වූ ඉඩම් කැබැල්ලට මායිම්:

1. කැබලි අංක 1 – **ගෝනමඩවත්ත - ප්‍රමාණය: හෙක්. 1.7793**
උතුරට: ඇළ සහ මාර්ග (මාසංආ); නැගෙනහිරට: මාර්ගය සහ ගොනමඩවත්ත; දකුණට: ගොනමඩවත්ත, මාර්ග (මාසංඅ) සහ ගෝනමඩවත්ත; බටහිරට: ගෝනමඩවත්ත.

EOG 06 – 0052

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) යටතේ ආඥාව

**2024 අංක 48 දරන ආඥාව**

මගේ යොමු අංකය: LD/05/2009/A258.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: MLB/LND/LNDAQ/LI/22-1.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 (අ) වැනි වගන්තිය යටතේ ආඥාවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම, පහත සඳහන් උපලේඛනයේ 1 වැනි තීරයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට *නැතහොත්*, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි තීරයේ දැක්වෙන නියමිත ඉඩම භුක්තියට ගැනීමට මෙයින් නියම කරමි.

**හරින් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

2024 මාර්තු මස 20 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර" අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

**උපලේඛනය**

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.–** ප්‍රාදේශීය ලේකම්, මාලිම්බඩ.

2. **ඉඩමේ විස්තරය.–** දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාලිම්බඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිගම් කෝරළය සුළු කොට්ඨාසයේ, කොට්ඨාස අංක 351 A කිරිමැටිමුල්ල උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසය කිරිමැටිමුල්ල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංක මාර 2598 හා 2014.05.30 දිනැති මූලික පිඹුරේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අංක 02 – ජොනිඩෙල්වත්ත ප්‍රමාණය: හෙක්. 13.3105**
උතුරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන ජොනිඩෙල්වත්ත (කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය), පිටවාන ඩී.ආර්.ඒ.ලීලාවතී හිමිකම් කියන අරමනදූව සහ මාර්ගය; නැගෙනහිරට: එම්.පී.එදිරිසූරිය හිමිකම් කියන වැලිගමුගවත්ත, ගුණසේන ගමගේ සහ තවත් අය හිමිකම් කියන බඳුවත්ත, කරුණාපාල ගමගේ සහ තවත් අය හිමිකම් කියන වෑකඩවලවත්ත, කේ.පී. සිරිපාල සහ තවත් අය හිමිකම් කියන මහදූවකනත්ත, කැබලි අංක 3 සහ පූජ්‍ය සුල්තානාගොඩ ජනානන්ද හිමි හිමිකම් කියන පන්සලවත්ත; දකුණට: කේ.පී. සිරිපාල සහ තවත් අය හිමිකම් කියන මහදූවකනත්ත, පූජ්‍ය සුල්තානාගොඩ ජනානන්ද හිමි හිමිකම් කියන පන්සලවත්ත, තිලකා හෙට්ටිආරච්චි සහ තවත් අය හිමිකම් කියන කෝට්ටවත්ත *නොහොත්* මහවත්ත, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන ජොනිඩෙල්වත්ත (සංස්කෘතික මධ්‍යස්ථානය) සහ කැබලි අංක 04; බටහිරට: කැබලි අංක 4,1 ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන ජොනිඩෙල්වත්ත (කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය), පිටවාන ඩී.ආර්.ඒ.ලීලාවතී හිමිකම් කියන අරමනදූව.

2. **කැබලි අංක 03 – ජොනිඩෙල්වත්ත ප්‍රමාණය: හෙක්. 0.0157**
උතුරට: කැබලි අංක 2; නැගෙනහිරට: කේ.පී. සිරිපාල සහ තවත් අය හිමිකම් කියන මහදූවකනත්ත; දකුණට: කේ.පී. සිරිපාල සහ තවත් අය හිමිකම් කියන මහදූවකනත්ත සහ කැබලි අංක 2; බටහිරට: කැබලි අංක 2.

EOG 06 – 0053

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.